# <u>පිසූ ආහාර සැපයිම - 2026</u>
# <u>ලංසුකරුවන්ට උපදෙස්</u>

බදුල්ල/මොණරාගල දිස්ත්‍රික්ක වල රෝහල් සඳහා 2026 වර්ෂයේ පිසූ ආහාර සැපයුම්කරුවන් පහත උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

**01.** ලංසු ආකෘතිපත්‍ර ලබා ගැනීම.

ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව මගින් සෞඛ්‍ය 50 ලංසු ආකෘති පත්‍රය නිකුත් කරන ලබන අතර අසාධු ලේඛනයට ඇතුළත් කර ඇති ආහාර කොන්ත්‍රාත්කරුවන්ට ලංසු ආකෘති පත්‍ර නිකුත් කරනු නොලැබේ.

**02.** ලංසු ආකෘතිපත්‍ර සම්පූර්ණ කිරීම

සෞඛ්‍ය 50 ලංසු ආකෘතිපත්‍ර "මුල් පිටපත" "අනු පිටපත" ලෙස ආකෘති පත්‍ර දෙකකින් නිකුත් කරනු ලබන අතර එම ආකෘති පත්‍ර දෙකම එකම ආකාරයකට සම්පූර්ණ කර මුල් පිටපත හා අනු පිටපත වෙන වෙනම ලියුම් කවරවල බහා ලියුම් කවරයේ වම්පස ඉහල කෙළවරේ "2026 වර්ෂය සඳහා පිසූ ආහාර සැපයිම, ......................." රෝහලේ නම සඳහන් කර මුල් පිටපතද අනු පිටපතද යන්න ලිවිය යුතුය. ලංසු ආකෘති පත්‍රයේ ඇති උපලේඛනයේ සියළුම ආහාර සැපයීමට තමන් අපේක්ෂා කරන මිල ගණන් පැහැදිලිව සඳහන් කර එකතු කිරීම් වෙනස් කිරීම් පැහැදිලිව සටහන් කර කෙටි අත්සන යොදා සනාථ කළ ලංසු පත්‍රය අත්සන් කර තිබිය යුතුය.

**03.** කොන්ත්‍රාත්තුව භාර ගැනීම

රෝගීන්ට ආහාර සැපයීම වගකිව යුතු කාර්යයක් වන හෙයින් ආහාර සැපයිම සඳහා ගිවිසුම් අත්සන් තළ පසු නිසි පරිදි නොකඩවා ආහාර සැපයිය යුතු අතර, අතර මඟදි අදාළ රෝහල/ ආයතනය වෙත ආහාර සැපයීම නතර කළහොත් හෝ රෝගීන්ට නුසුදුසු ආහාර සපයා වාර්තා වුවහොත්, ලංසු කොන්දේසි හා උපදෙස් උල්ලංඝණය කරන ලංසු අයදුම්කරුවන්ගේ ගිවිසුම් අවලංගු කර, ගිවිසුම් ප්‍රකාරව ඇප මුදල් රාජසන්තක කිරීමට සිදුවනු ඇත. ඕනෑම ලංසුවක් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ පූර්ණ අයිතිය ප්‍රසම්පාදන මණ්ඩලය සතුය.

**04.** C ශ්‍රේණියේ හෝ B ශ්‍රේණියේ ප්‍රාදේශිය රෝහලක වසරක කාලයක් සඳහා පිසූ ආහාර සාර්ථකව ලබාදි පලපුරුද්දක් ඇත්නම් Aශ්‍රේණියේ ප්‍රාදේශිය රෝහල් සඳහාද, A හෝ B ශ්‍රේණියේ ප්‍රාදේශිය රෝහලක වසරක කාලයක් සඳහා ආහාර සාර්ථකව ලබාදි පලපුරුද්දක් ඇත්නම් B ශ්‍රේණියේ මුලික රෝහල් සඳහාද, B ශ්‍රේණියේ මුලික රෝහලක වසරක කාලයක් සඳහා පිසූ ආහාර සාර්ථකව ලබාදි පලපුරුද්දක් ඇත්නම් A ශ්‍රේණියේ මුලික රෝහලක් සඳහාද ඉල්ලුම් කිරිමට හැකියාව ඇත. C හා B ශ්‍රේණියේ ප්‍රාදේශිය රෝහල් සඳහා පලපුරුද්දක් අවශ්‍ය නොවේ.

**05.** ඉදිරිපත් කරන ලබන මිල ගණන් යටතේ 2026 වර්ෂය පුරාම ආහාර සැපයිය යුතු වන බැවින් මිල ගණන් ඉදිරිපත් කිරීමේදී ඒ පිළිබඳව අවධානය යොමු කළ යුතුය.

**06.** වැට් බදු ගෙවනු ලබන්නේ වැට් ලියාපදිංචි සහතිකය ඉදිරිපත් කරනු ලබන සක්‍රියව වැට් බදු ගෙවන සැපයුම් කරුවන්ට පමණි. ලංසු පත සමඟ වැට් ලියාපදිංචි සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුය.

**07.** ලංසු කරුවන්ට මෙම ලංසු පිළිබඳව වැඩි විස්තර ලබා ගැනීමට හෝ යම් කරුණු පැහැදිලි කර ගැනීමට අවශ්‍ය නම් ඌව පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුවෙන් විමසිය යුතුය.

**08.** ඉදිරිපත් කරනු ලබන ලංසුව 2026.02.12 දින දක්වා වලංගු විය යුතුය.

**09.** ලංසු ඉදිරිපත් කිරීමට පෙර සෞඛ්‍ය අමාත්‍යාංශය මගින් නිකුත් කර ඇති අංක 01/21/2015 දරන 2015/05/28 දිනැති පොදු චක්‍රලේඛ පිළිබඳ අවධානය යොමු කරන්න.

10. මිල ගණන් ඉල්ලා ඇති ආකෘති පත්‍රයේ සඳහන් එක් එක් පිසූ ආහාර වටයක් සම්බන්ධයෙන් වෙන වෙනම වැය වන මිල දැක්විය යුතු අතර, සෑම ඒකකයකටම මිල ගණන් ඉදිරිපත් කිරිම අනිවාර්ය වේ.(අදාල උපලේඛණයේ සඳහන් ප්‍රමාණයන් සඳහා මිල ගණන් ඉදිරිපත් කල යුතුය.)

11. දිනපතාම ආයතන භාර නිලධාරියා ඉල්ලා සිටින පරිදි ආයතනය තුළ දී ආහාර පිසීම සිදු කළ යුතු අතර, ඒ සඳහා අදාල පරිදි මිල ගණන් ඉදිරිපත් කල යුතුය.

12. මිල ගණන් සඳහන් කිරිමේදි අපැහැදිලි මිල සඳහන් කිරිම් ඇතුලත් ලංසු පත් ප්‍රතික්ෂේප කිරිමට ඉඩ ඇති බැවින් හැකිතාක් දුරට වෙනස් කිරිම් වලින් තොර පැහැදිලි මිල ගණන් ඉදිරිපත් කළ යුතුය.

13. ඕනෑම පිසූ ආහාර වටයක හෝ සියල්ලම හෝ ඉදිරිපත් කළ මිළ ගණන් කිසිදු පැහැදිලි කිරිමකින් තොරව ප්‍රතික්ෂේප කිරිමේ අයිතියක් කිසියම් ලංසුවක් හෝ ඉන් කොටසක් පිළිගැනිම හෝ ප්‍රතික්ෂේප කිරිමත් ප්‍රසම්පාදන මණ්ඩලය සතුය.

14. ආහාර වටයක් යනු (- දිනකට රෝගියෙකුගේ ආහාර වටය යනු කිසියම් දිනක මධ්‍යහ්න 12.00 සිට ඊට පසුදා මධ්‍යහ්න 12.00 දක්වා වන පැය 24ක කාලය සඳහා රෝගියෙකුට අවශ්‍ය වන සම්පූර්ණ ආහාර ප්‍රමාණය වේ.

15. ඇණවුම් කරන ලද ආහාර වට වර්ග

(අ). රෝගීන් සඳහා

I. සාමාන්‍ය සම්පූර්ණ ආහාර වටය. (උපලේඛන අංක 02, 03)
II.සාමාන්‍ය අර්ධ ආහාර වටය (අවු 6ත් 12ත් අතර ළමුන් සඳහා උපලේඛණ අංක 02,03 අඩක්)
III. ළමා රෝගීන්ගේ ආහාර වටය (උපලේඛණ අංක 04)
IV . දීර්ඝ කාලින රෝගීන්ගේ ආහාර වන උදා :- ක්ෂය රෝග, ලදුරු, පිළිකා, මානසික, පිළිස්සුම්, පුනරුත්ථාපන රෝහල් වල සිටින ආබාධිත රෝගීන් වැනි රෝගීන් සඳහා ආහාර වටය. (උපලේඛන අංක 05, 06, 07 )
V. අධි ප්‍රෝටින් ආහාර වටය ( උපලේඛන අංක 08,09)
VI. දිය වැඩියා රෝගීන්ගේ ආහාර වටය. ( උපලේඛන අංක 10, 11)
VII. වකුගඩු රෝගීන්ගේ ආහාර වටය. (උපලේඛන අංක 12)
VIII. අධි ප්‍රෝටින්/අධි ශක්ති ආහාර වේල(උපලේඛන අංක 13)
IX. දියර ආහාර වටය(උපලේඛන අංක 14)
X. විශේෂිත ආහාර වටය(වෛද්‍ය උපදෙස් මත)

(ආ) සේවකයින් සඳහා

I. කණිෂ්ඨ සේවකයින්ගේ අර්ධ ආහාර වටය. (උපලේඛන අංක 15)

16. ආහාර ද්‍රව්‍ය භාර ගැනීම සඳහා යෙදිය යුතු වැඩපිළිවෙල.

ආහාර ඇණවුම් පිළියෙල කර ගැනීම සහ ආහාර ද්‍රව්‍ය භාර ගැනීම සඳහා කටයුතු පිළියෙල කිරිම ආයතන ප්‍රධානියා සතු වගකීමකි. එබැවින් කුමන හේතුවක් නිසාවත් ඉහත සඳහන් වැඩ පිළිවෙල ක්‍රියාත්මක කළ නොහැකි වුවහොත් මෙම අත්‍යාවශ්‍ය රෝගී සත්කාරක සේවාව රජයට උපරිම වාසි සහගත වන අයුරින් පවත්වා ගෙන යාමට සතුටුදායක වැඩ පිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතුය. ඒ බව විමධ්‍යගත කොට්ඨාශ ප්‍රධානියා/ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ වෙත වහාම වාර්තා කළ යුතුය.

17. ආහාර ද්‍රව්‍ය භාර ගැනීමේදී අනුගමනය කළ යුතු කරුණු.

I. ඉදුණු කෙසෙල් ගෙඩියක දිග අඟල් 3ක් වත් විය යුතු අතර, විෂ්කම්භය අඟල් 1 ½ ක් විය යුතුය.

II. අළුත් එළවළු පමණක් භාරගත යුතුය. එළවළු වලින් හෝ පළතුරුවලින් කොටසක් නරක් වී හෝ කෘමින් කා ඇත්නම්,ඒවා ප්‍රතික්ෂේප කළ යුතු අතර, එසේ ප්‍රතික්ෂේප ද්‍රව්‍ය වෙනුවට එම ද්‍රව්‍ය හෝ නම් කර ඇති ආදේශක ද්‍රව්‍ය කොන්ත්‍රාත්කරු සැපයිය යුතුය.

III. පාන් නියමාකාරයෙන් පුළුස්සන ලද ග්‍රෑම් 450 ට නොඅඩු පාන් ගෙඩි විය යුතුය. ඒවා ගුණාත්මකභාවයෙන් යුතුව බර සහ සංඛ්‍යාවට අනුව බාර ගත යුතුය.

IV . මාළු සඳහා හැකි සෑම විටම අළුත් මාළු සපයා ගත යුතුය. අපහසු අවස්ථාවලදී පමණක් ටින් මාළු ලබා ගත යුතුය. මාළුසැපයීමේදී එහි ශුද්ධ බර නිවැරදිව භාර ගත යුතුය.

V. බිත්තර සෝදා පිරිසිදු කරගත් නොබිඳුණු බිත්තර විය යුතුය.

VI. උම්බලකඩ සැපයීමේදී හොද තත්වයේ උම්බලකඩ බවට සහතික විය යුතුය.

VII. තෙල් භාවිතයේදී හැකි සෑම විටම පිරිසිදු පොල් තෙල් භාවිතා කළ යුතුය.

VIII. පහත සඳහන් වේලාවන් තුළදී රෝගීන්ට ආහාර සැපයිය යුතුය.

(අ) සවස තේ පානය - ප.ව 2.30

(ආ) රෑ කෑම - ප.ව 5.30

(ඇ) උදේ තේ පානය - පෙ.ව 6.30

(ඈ) දිවා ආහාරය - පෙ.ව 11.30

18. ලංසු පිරිනැමීමෙන් පසු ලංසුකරුට අන් අයකුට පැවරීම හෝ අතුරු බඳු දීම හෝ කළ නොහැකිය.

19. ලංසුකරු විසින් තම කොන්දේසි ක්‍රියාත්මක කිරීමේදී අනවශ්‍ය පුද්ගලයකු සේවයේ යොදවා ගැනීම ගැන තම විරෝධය ලිඛිතව දැනුම් දීමේ අයිතිය ප්‍රසම්පාදන මණ්ඩලය සතුය. කොන්ත්‍රාත්තුව ඉටු කිරීම සඳහා එවැනි තැනැත්තෙකු ලංසුකරු විසින් සේවයේ යොදවා ගත යුතු නොවේ.

20. තෝරා ගනු ලැබූ ලංසුකරු විසින් ඌව පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ නමින් 2026.01.01 දින සිට 2027.01.28 දින දක්වා කාලය සඳහා වලංගු වන පරිදි නියමිත ආකෘති පත්‍රයේ කොන්දේසි විරහිත කාර්ය සාධන බැඳුම්කරයක් ගිවිසුම් ගත මුදලින් 10%ක් වන සේ ශ්‍රී ලංකාවේ පිළිගත් බැංකුවක් මඟින් හෝ එම මුදල මුදලින් තැන්පත් කල යුතුය.

21. සැපයිය යුතු යැයි මෙහි උපලේඛනයේ සඳහන් පිසූ ආහාර වටයක් සඳහා ඉදිරිපත් කරනු ලබන මිල ප්‍රමාණයන් වෙලදපොලේ පවත්නා තත්කාලින මිල ගණන් වලට අනුරූප විය යුතුය. වෙළඳපොලේ පවත්නා මිල ගණන් වලට සාතිශයින්ම අනුරූප නොවන මිල ප්‍රමාණයන් දක්වන ලංසුකරුවන්ගේ ලංසු ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකිය.

22. ලංසු පිළිගත් බව දැන්වීමෙන් පසු දින 14ක් ඇතුළත තෝරා ගනු ලැබූ ලංසුකරු විසින් අවශ්‍ය ඇප මුදල් තැන්පත් කර ගිවිසුමකට එළඹීම කළ යුතුය. එය පැහැර හැරියහොත් ඔහුගේ සැපයුම ලියාපදිංචිය අහෝසි

වන අතර, ප්‍රසම්පාදන මණ්ඩලයේ අභිමතය පරිදි සැපයුම් ලේඛනයේ ඊලඟ කොන්ත්‍රාත්කරුගෙන් අදාළ සේවාව ලබා ගැනිමට කටයුතු කරනු ලැබේ.

23. ඔබ විසින් ලබාදෙනු ලබන වත්කම් සහතිකය ප්‍රසම්පාදන කටයුතු අවසන් වන තෙක් කිසිදු හේතුවක් මත නැවත ලබා දෙනු නොලබන අතර වත්කම් සහතික වල ඉතිරි වීම් වෙනත් ආයතනයක ප්‍රසම්පාදන කටයුතු වලට ලබා දෙනු නොලැබේ. එබැවින් ඔබ විසින් ඉල්ලුම් කරනු ලබන රෝහල් වලට සරිලන පරිදි වත්කම් සහතික ඉදිරිපත් කිරිමට වග බලා ගත යුතු වේ.

24. ලංසු ලියවිලි ලෙස ලබා දෙන ඉල්ලුම් පත්‍රය ඇතුළු ආකෘති පත්‍රවල සියළුම ස්ථාන වල ලංසුකරු විසින් අත්සන් තබා නිසි පරිදි සම්පූර්ණ කර තිබිය යුතු අතර, එසේ නොමැති ලංසු අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

25. ආහාර පිසීමේ කාර්යය ගෑස් ලිප් සහ ගෑස් සිලින්ඩර් භාවිතයෙන් සිදු කළ යුතුය. එක් ආහාර වටයක් පිසීම සඳහා වැය වන ගෑස් සඳහා වැය වන පිරිවැය, ඔබ විසින් ඉදිරිපත් කරන ආහාර වටයක පිරිවැය සඳහා ඇතුළත් කළ යුතුය. අවශ්‍ය ගෑස් සිලින්ඩර් හා ගෑස් ලිප් ඔබ විසින් සපයා ගත යුතුය.

26. ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය - 2024 හි 1.5 හි, (ඇ) වගන්තියට අදාළව ලංසුකරුවන් විසින් ලබා දිය යුතු අනිවාර්යය ප්‍රකාශය සඳහා වන ආකෘතිය " දූෂසන්ධානීය නොවන බවට වන දිවුරුම් ප්‍රකාශය" මැයෙන් මෙම ලේඛනයේ අවසන් පිටුවට ඇතුළත් කර ඇත. එකී ප්‍රකාශය සෑම ලංසුකරුවෙකු විසින්ම සම්පූර්ණ කර, ලංසුව සමග භාර දිය යුතුය.